ඇමරිකානු තානාපති කාර්යාලය
උද්‍යානකරු ඇබෑර්තුව (GARDENER)

ඔබට ආයතනයක උද්‍යානකරුවකු ලෙස සේවය කර වසරක පළපුරුද්දක් තිබේද? එමෙන්ම, එම කාර්යයන් පිළිබඳ මනා දැනුමක් මෙන්ම, ඒ සම්බන්ද අත්මෙවළම් සහ යන්ත්‍ර භාවිතා කිරීමේ හැකියාව තිබේද? තවද ඔබට ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අවම වශයෙන් සාමාන්‍ය දැනුමක් තිබේද? (ඉංග්‍රීසි දැනුම පරීක්ෂා කරනු ලැබේ) එමෙන්ම ඔබ පහත සඳහන් සුදුසුකම්ද සපුරන්නේද?

එසේනම්, පහත සඳහන් කරුණු ඇතුළත්ව සකසන ලද මුල් පිටුවක් සමගින් ඔබගේ සවිස්තරාත්මක අයදුම්පතක් නොපමාව අප වෙත යොමු කරන්න. (හැකිනම් අධ්‍යාපන සහ සේවා සහතික පිටපත්ද අමුණා එවන්න)

අයදුම් පත්‍රයේ මුල් පිටුව:

1. අයදුම් කරන තනතුර 2. අයදුම්කරුගේ සම්පූර්ණ නම 3. වර්තමාන ලිපිනය 4. දුරකථන අංකය

5. ජාතික හැඳුනුම්පත් අංකය 6. ඔබ වයස අවුරුදු 18-60 අතරද? (ඔව්/නැත) 7. ඔබ අ.පො.ස. සාමාන්‍ය පෙළ පංතිය දක්වා අධ්‍යාපනය හදාරා තිබේද? (ඔව්/නැත.ඔව් නම්, ඔබ සමත් ඉහලම ශ්‍රේණිය) 8. ඔබට උද්‍යානකරුවකු ලෙස ආයතනයක සේවය කර වසරක පළපුරුද්දක් තිබේද? (ඔව්/නැත."ඔව්" නම්, ආයතනයේ නම, තනතුර, සේවා කාලය - අවු /මාස) 9. වලංගු "B" (පෙර C, C1) කාණ්ඩයේ රියදුරු බලපත්‍රයක් ඔබ සතුද? (ඔව්/නැත. "ඔව්" නම්,රියදුරු බලපත්‍ර අංකය) 10. ඔබගේ වර්තමාන මාසික වැටුප?

දින හතරහමාරක (4 1/2) වැඩ සතියක් සමග ඔබගේ සේවය සඳහා පිරිනමන මාසික ආරම්භක වැටුප රු.23,800/= කි.

මුල් පිටුව පමණක් හෝ මුල් පිටුව අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැකි බව කරුණාවෙන් සළකන්න. තවද, සේවයට බඳවාගන්නා අවස්ථාවේදී සියලුම සහතික පත් සහ ලේඛණයන්හි නිරවද්‍යතාවය විධිමත්ව පරීක්ෂා කරනු ලැබේ.

ඔබගේ සම්පූර්ණ අයදුම්පත තැ.පෙ. 106, කොළඹ යන ලිපිනයට හෝ ColomboHR@state.gov යන විද්‍යුත් තැපෑලට 2012 ජූලි මස 24 දිනට පෙර එවිය යුතුය. ලියුම් කවරය ඉහළ වම් කෙළවර හෝ ඉලෙක්ට්‍රොනික තැපෑලෙන් එවන්නේ නම් එහි **Subject Line** හි ඔබ අයදුම් කරන තනතුර සඳහන් කරන්න.

- ✓ මෙම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු හේතුවක් මත සලකා නොබැලේ.
- ✓ තෝරා ගනු ලබන අපේක්ෂකයන්ට පමණක් ප්‍රතිචාර ලිපි/දුරකථන ඇමතුම් ලැබෙනු ඇත.

ඔබට අප පිළිබඳව තවදුරටත් දැනගැනීමට අවශ්‍ය නම්, http://srilanka.usembassy.gov/ වෙබ් අඩවියෙන් වැඩි විස්තර ලබා ගත හැක. U.S. Embassy is an Equal Opportunity Employer.